# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,471 - 2026 ජනවාරි මස 09 වැනි සිකුරාදා - 2026.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 54 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 75 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 30 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2026 ජනවාරි මස 02 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


51 - B 82753 - (2026/01)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා නාවික හමුදාව

## ශ්‍රී ලංකා නාවික හමුදාවේ කෙටි කාලීන අධිකාරිය සහ ඉදුරාම බඳවා ගන්නා නිත්‍ය / ස්වේච්ඡා නිලධාරින්ගේ / නිලධාරිනියන්ගේ පුරප්පාඩු - 2026

**1.** ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ (කෙටි හා දීර්ඝ කාලීන) අධිකාරිය සහ ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ඉදුරාම බඳවා ගැනීමේ නිලධාරි/ නිලධාරිනියන්ගේ පුරප්පාඩු පවතී.

**2.** පහත සඳහන් අංශයන් සඳහා දක්වා ඇති පරිදි අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

නිත්‍ය නාවික හමුදාවේ ඉදුරාම බඳවා ගැනීමේ නිලධාරින් (කෙටි කාලීන වසර 05 ක් සඳහා සහ දීර්ඝ කාලීන අධිකාරිය)

(අ.) විධායක අංශය
(ආ.) සාගරික ඉංජිනේරු අංශය
(ඇ.) මෝටර් රථ ඉංජිනේරු අංශය
(ඈ.) සැපයුම් අංශය
(ඉ.) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය
(ඊ.) සිවිල් ඉංජිනේරු අංශය
(උ.) දන්ත වෛද්‍ය අංශය
(ඌ.) තොරතුරු තාක්ෂණ අංශය
(එ.) නාවික පාබල අංශය
(ඒ.) පරිපාලන නිලධාරි සෞඛ්‍ය
(ඔ.) තූර්ය වාදක අංශය

ස්වේච්ඡා නාවික හමුදාවේ ඉදුරාම බඳවා ගැනීමේ නිලධාරින්

(අ.) විධායක අංශය (පොදු රාජකාරි)
(ආ.) විධායක අංශය (ඉංග්‍රීසි උපදේශක නිලධාරි)
(ඇ.) විධායක අංශය (ගිණුම් නිලධාරි)
(ඈ.) මනෝ උපදේශන නිලධාරි

**3.** මූලික අධ්‍යාපන සුදුසුකම්:-

අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සහ ඉංග්‍රීසි විෂයයන්වලට සම්මාන (C) සාමාර්ථයන් සමඟ ගණිතය විෂය ඇතුළත්ව විෂයයන් 06ක් සමත්ව තිබීම;

*හෝ*

අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සඳහා සම්මාන (C) සාමාර්ථයක් සමඟ ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව විෂයයන් 06ක් සමත් වී තිබීම හා ඉංග්‍රීසි විෂය සම්බන්ධව ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**4.** උසස් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්;

**(අ.) විධායක අංශය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | භෞතීය විද්‍යා, ජෛවීය විද්‍යා හෝ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවක් යටතේ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත්ව තිබීම; |

| | | |
|---|---|---|
| | | *හෝ* <br> නිශ්චිත විෂය ධාරාවකට අයත් නොමැතිව අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය(ICT)විෂයය ඇතුලුව) සමත්ව තිබීම; <br> *සහ* <br> විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය ආයතනයකින් විද්‍යාවේදී හෝ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතු ය. |

**(ආ.)** **<u>සාගරික ඉංජිනේරු අංශය</u> (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සමුද්‍ර, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පූර්ණ කාලීන වසර 04 ක BSc ඉංජිනේරු උපාධියක් ලබා තිබිය යුතු ය. <br> ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පූර්ණ සාමාජිකත්වය/ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතු ය. <br> ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ. |
| වයස | - | අවුරුදු 32ට අඩු විය යුතුය. |

**(ඇ.)** **<u>මෝටර් රථ ඉංජිනේරු අංශය</u> (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර 04 ක BSc ඉංජිනේරු උපාධියක් ලබා තිබිය යුතු ය. <br> ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පූර්ණ සාමාජිකත්වය/ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතු ය. <br> ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ. |
| වයස | - | අවුරුදු 32 ට අඩු විය යුතුය. |

**(ඈ.)** **<u>සැපයුම් අංශය</u> (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) සමත්වීම සහ අ.පො.ස (උ.පෙළ) සමත්ව තිබීම. |

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය, අලෙවි කළමනාකරණය හෝ සැපයුම් දාම කළමනාකරණය හෝ වානිජ විෂයය පථයට අදාළව විශේෂ උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතු ය.

**(ඉ.) <u>විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය</u> (නිත්‍ය නාවික හමුදාව)**

**නිලය - උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විදුලි/ විද්‍යුත් / විදුලි සංදේශ යන විෂයයන් සම්බන්ධයෙන් පූර්ණ කාලීන වසර 04ක ඉංජිනේරු උපාධියක් / වසර 04ක B.Tech උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතු ය.

**(ඊ.) <u>සිවිල් ඉංජිනේරු අංශය</u> (නිත්‍ය නාවික හමුදාව)**

**නිලය - ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පූර්ණකාලීන වසර හතරක BSc. ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) Associate Member හෝ ඊට ඉහළ සාමාජිකත්වයක් ලබා තිබීම.

ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

වයස - අවුරුදු 32 හෝ ඊට අඩු විය යුතු ය.

**(උ.) <u>දන්ත වෛද්‍ය අංශය (නිත්‍ය නාවික හමුදාව)</u>**

**නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - දන්ත වෛද්‍ය පීඨයේ 05 හා 06 වර්ෂාර්ධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ 02 වන දන්ත ශල්‍ය වෛද්‍ය (BDS) විභාගය සමත්ව තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාව 04 වන වසර අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටීම.

වයස් සීමාව - අවුරුදු 30 ට අඩු විය යුතු ය.

**නිලය - උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - දන්ත වෛද්‍ය පීඨයේ 07 හා 08 වර්ෂාර්ධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ අවසාන දන්ත ශල්‍ය වෛද්‍ය (BDS) විභාගය පළමු කොටස සමත්වී තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාව අවසන් වසර අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටීම.

වයස් සීමාව - අවුරුදු 32 ට අඩු විය යුතු ය.

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **වෛද්‍ය ලුතිනන් (දන්ත)** |
| ස්ත්‍රී/ පුරුෂ භාවය | - | පිරිමි/ කාන්තා |
| අධ්‍යාපන සුදුසුකම් | - | දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය (BDS) හෝ ඊට සමාන සුදුසුකමක් සමඟ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) නිත්‍ය ලියාපදිංචිය ලබා තිබීම. |
| වයස් සීමාව | - | අවුරුදු 35 ට අඩු විය යුතු ය. |

**(උ.) <u>තොරතුරු තාක්‍ෂණ අංශය</u> <u>(නිත්‍ය නාවික හමුදාව)</u>**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සහිතව සමත් වී තිබීම සහ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම;<br>*සහ*<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් තොරතුරු තාක්‍ෂණය, පරිගණක විද්‍යාව හෝ පරිගණක විෂය ආශ්‍රිත උපාධියක් හදාරා තිබීම;<br>*හෝ*<br>අන්තර් ජාතිකව පිළිගත් Red hat හෝ Sun Solaris හෝ Ethical Hacker වැනි සහතිකපත්ලාභියකු වීම. |
| වයස | - | අවුරුදු 32ට අඩු විය යුතු ය. |
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සහිතව සමත් වී තිබීම සහ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම;<br>*සහ*<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් තොරතුරු තාක්‍ෂණය හෝ පරිගණක විද්‍යාව හෝ පරිගණක විෂය ආශ්‍රිත වසර 03 ක උපාධියක් හදාරා තිබීම;<br>සහ<br>පිළිගත් ආයතනයක තොරතුරු තාක්‍ෂණ විෂය ආශ්‍රිත අවම වසරක සේවා පළපුරුද්දක් ලබා තිබිම. |
| වයස | - | අවුරුදු 32ට අඩු විය යුතු ය. |
| **නිලය** | **-** | **ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සහිතව සමත් වී තිබීම සහ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම; |

*සහ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් තොරතුරු තාක්‍ෂණ, පරිගණක විද්‍යාව හෝ පරිගණක විෂය ආශ්‍රිත විශේෂ උපාධියක් ලබා තිබීම.

පිළිගත් ආයතනයක තොරතුරු තාක්‍ෂණ විෂය ආශ්‍රිතව අවම වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතු ය.

**(එ.) <u>නාවික පාබල අංශය</u> (නිත්‍ය නාවික හමුදාව)**

**නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) අනුමැතිය ලත් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් කලා, වාණිජ, කළමනාකරණය, ජීවවිද්‍යාව හෝ ඉංජිනේරු යන විෂය ධාරාවන්ගෙන් උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතු ය.

**නිලය - උප ලුතිනන් (පිරිමි)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) අනුමැතිය ලත් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් කලා, වාණිජ, කළමනාකරණය, ජීවවිද්‍යාව හෝ ඉංජිනේරු යන විෂය ධාරාවන්ගෙන් විශේෂ උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතු ය

**(ඒ.) <u>පරිපාලන නිලධාරි සෞඛ්‍ය</u> <u>(නිත්‍ය නාවික හමුදාව)</u>**

**නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයක් හෝ වෙනත් ආයතනයක් මඟින් හෙද හෝ පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම.

පළපුරුද්ද - රෝහල් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02ක අධීක්‍ෂණ පළපුරුද්ද

ලියාපදිංචිය - අදාළ වෘත්තීය සඳහා ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම අනිවාර්යය වේ.

වයස - අවුරුදු 30ට අඩු විය යුතු ය.

**(ඔ.) <u>තූර්ය වාදක පාලක (නිත්‍ය නාවික හමුදාව)</u>**

**නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි / කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත හෝ නර්තන විෂය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය/ විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත හෝ නර්තන විෂය පිළිබඳ ලලිත කලාවේදී සාමාන්‍ය/ විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත හෝ නර්තන විෂය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය/ විශේෂ උපාධියක් ලබා තිබීම.

අමතර සුදුසුකම් - බටහිර/ ඉන්දියානු සංගීත හෝ නර්තන විෂය පිළිබඳව හදාරා ඇති වෙනත් පාඨමාලා.

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෙනත් ජයග්‍රහණ.

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සංගීත හෝ නර්තන වැඩසටහන් සඳහා සහභාගී වී තිබීම සහ ලබා ඇති ජයග්‍රහණ.

සියලුම අයදුම්කරුවන් විසින් සුදුසුකම් ලැබීමේ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගී වීම අනිවාර්ය වේ.

වයස - අවුරුදු 28 ට අඩු විය යුතු ය

**නිලය - උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත හෝ නර්තන විෂය පිළිබඳව ප්‍රාසාංගික කලාවේදී විශේෂ උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත හෝ නර්තන විෂය පිළිබඳ ලලිත කලාවේදී විශේෂ උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත හෝ නර්තන විෂය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම.

අමතර සුදුසුකම් සහ ප්‍රායෝගික පරීක්ෂණ - බටහිර/ ඉන්දියානු සංගීත හෝ නර්තන විෂය පිළිබඳ හදාරා ඇති වෙනත් ප්‍රායෝගික පරීක්ෂණ පාඨමාලා.

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෙනත් ජයග්‍රහණ

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සංගීත හෝ නර්තන වැඩසටහන් සඳහා සහභාගී වී තිබීම සහ ලබා ඇති ජයග්‍රහණ.

සියලුම අයදුම්කරුවන් විසින් සුදුසුකම් ලැබීමේ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගී වීම අනිවාර්ය වේ.

වයස - අවුරුදු 28 ට අඩු විය යුතු ය.

(ඔ.) විධායක අංශය (ස්වේච්ඡා නාවික හමුදාව) පොදු රාජකාරි

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **වැඩ බලන උප ලුතිනන්** (පිරිමි/කාන්තා) |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතු ය. |

(ක.) විධායක අංශය (ස්වේච්ඡා නාවික හමුදාව) ඉංග්‍රීසි භාෂා උපදේශක

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා උපාධියක් (TESOL) ලබා තිබීම;<br>*හෝ*<br>ගුරු පුහුණු විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම සමඟ රජයේ හෝ පිළිගත් ආයතනයක වසර 01 ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 35ට අඩු විය යුතු ය. |

(ඛ.) විධායක අංශය (ස්වේච්ඡා නාවික හමුදාව) ගිණුම් නිලධාරි

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **වැඩ බලන උප ලුතිනන් (පිරිමි)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමැතියලත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර කළමනාකරණ, ගිණුම්කරණ හෝ වාණිජවේදී විශේෂ උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතු ය. |

(ග.) (ස්වේච්ඡා නාවික හමුදාව) මනෝ උපදේශන නිලධාරි

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමැතියලත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයක් මඟින් මනෝවිද්‍යා හෝ මනෝවිද්‍යා උපදේශනය පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම. |
| පළපුරුද්ද | - | මනෝවිද්‍යා උපදේශනය සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක /රෝහලක වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම හෝ අධීක්ෂණ කටයුතු පැය 600 ක් සම්පූර්ණ කර තිබීම. (ඒ බව සනාථ කරන සහතික ලිපි හෝ ලොග් වාර්ථා ඉදිරිපත් කළ යුතු ය) |
| වයස | - | අවුරුදු 34ට අඩු විය යුතු ය. |

**5. අනෙකුත් සුදුසුකම්:**

අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසීන් අනිවාර්යෙන්ම සපුරාලිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය. |
| ආ. | වයස | - | අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඒ ඒ අංශයන් යටතේ දක්වා ඇති පරිදි විය යුතු ය. |
| ඇ. | උස | - | පිරිමි - 5' 6" (සෙ.මී 167.64) නොඅඩු විය යුතු ය.<br>කාන්තා - 5' 3" (සෙ.මී160.02) නොඅඩු විය යුතු ය. |
| ඈ. | බර<br>(ශරීර ස්කන්ධ දර්ශකය) | - | පිරිමි - 17-27 නොඅඩු විය යුතු ය.<br>කාන්තා - 17-27 නොඅඩු විය යුතු ය. |
| ඉ. | පපුව (පිරිමි) | - | 32" (සෙ.මී 81.28) නොඅඩු විය යුතුය. |
| ඊ. | වර්ණ දෘෂ්ඨිය | - | එස්ටීඩී II (නිසි පෙනුම). |
| උ. | දෘෂ්ඨි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) (වෛද්‍ය, තූර්ය වාදක අංශය සහ සැපයුම් අංශයන් සඳහා පමණක් 6/12 දෘෂ්ඨි තීක්‍ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සලකා බැලිය හැක) |
| ඌ. | සිවිල් තත්වය | - | විවාහක/ අවිවාහක |

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්‍ෂතා ගැන නිසිලෙස සලකා බලනු ලැබේ. තවද, දැනටමත් රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවක නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.

7. ඉහත සඳහන් 3, 4 සහ 5 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

8. **සේවා කොන්දේසි :**

අ. අපේක්‍ෂකයින්/ අපේක්ෂිකාවන් නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරි/ නිලධාරිනි තනතුරු සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරීන්/ නිලධාරිනියන් සූදානමින් සිටිය යුතු ය.

ඇ. සියලුම නිලධාරින්/ නිලධාරිනියන් රාජකාරී හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතු ය.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන්පසුව නිලධාරීන්/ නිලධාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා පනත, නාවික හමුදා නියෝග සහ සංදේශ මඟින් බලාත්මක කරනු ලබන නීති රීති හා උපදෙස්වලටත් මින් මතුවට පනවනු ලබන නීති රීති හා උපදෙස්වලටත් යටත් විය යුතු ය.

ඉ. පුහුණුවන කාලසීමාව තුළදී යම් නිලධාරියෙකු/ නිලධාරිනියෙකු හට තම අපේක්‍ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මඟින් එම නිලධාරියා/ නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/ නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිලධාරියෙකුගේ/ නිලධාරිනියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ නිලධාරියා/ නිලධාරිනිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමඟ ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ නිලධාරින්/ නිලධාරිනියන් හට නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

**9**. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා:

තෝරාගනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

**10. වැටුප් හා දීමනා:**

ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025 අනුව වේ.

<u>දන්ත වෛද්‍ය අංශය සඳහා වැටුප;</u>

| *විස්තරය* | *ශ්‍රේණිය* | *වැබ උප ලුතිනන් (රු.)* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* |
|---|---|---|---|---|
| මූලික වැටුප | දන්ත වෛද්‍ය | 73,344.00 | 73,344.00 | 73,344.00 |
| ජීවන වියදම් දීමනාව | - | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | - | 525.00 | 525.00 | 525.00 |
| අතුරු දීමනාව | - | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | - | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 70,000.00 | 70,000.00 | 70,000.00 |
| විශ්‍රාම වැටුප් සහිත දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,700.00 | 1,700.00 | 1,700.00 |
| විශ්‍රාම වැටුප් රහිත දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,700.00 | 1,700.00 | 1,700.00 |
| විශේෂ අමතර දීමනාව (දන්ත වෛද්‍ය නිලධාරී) | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,500.00 | 1,500.00 | 1,500.00 |
| භාෂා දිමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,804.00 | 1,804.00 | 1,804.00 |
| සංනිවේදන දිමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| සලාක දීමනාව (අවස්ථාවට අනුව) | | 34,846.80 | 34,846.80 | 34,846.80 |
| | එකතුව | **210,219.80** | **210,219.80** | **210,219.80** |

<u>අනෙකුත් සියලු අංශයන් සඳහා වැටුප්;</u>

| *විස්තරය* | *වැඩ බලන උප ලුතිනන් (රු.)* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* |
|---|---|---|---|
| මූලික වැටුප | 59,633.00 | 66,726.00 | 76,653.00 |
| ජීවන වියදම් දීමනාව | 17,800.00 | 17,800.00 | 17,800.00 |

| *විස්තරය* | *වැඩ බලන උප ලුතිනන් (රු.)* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* |
|---|---|---|---|
| නිල ඇඳුම් දීමනාව | 525.00 | 525.00 | 525.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| සලාක දීමනාව (අවස්ථාවට අනුව) | 34,846.80 | 34,846.80 | 34,846.80 |
| **එකතුව** | **116,804.80** | **123,897.80** | **133,824.80** |

**11. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමිවන පහසුකම්, දීමනා හා වරප්‍රසාද ;**

*අ.* ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරීන්/ නිලධාරිනියන් සඳහා පමණක් හිමිවේ.

*ආ.* සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු. 637.50 ක් ගෙවනු ලැබේ.

*ඇ.* නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර යුගල් තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/ නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

*ඈ.* කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට/ නිලධාරිනියන්ට මසකට වරක් කඳවුරේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරී නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

*ඉ.* නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

*ඊ.* නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නිලධාරියාට/ නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට).

*උ.* රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට/ නිලධාරිනියන්ට රු.3,200.00 සිට රු.8,500.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

**12. අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට උපදෙස්;**

*අ.* පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිලි අත්අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2026 ජනවාරි මස 30 දින දහවල් 1200ට ප්‍රථම ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, තැපෙ 593, බත්තරමුල්ල."** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපැලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **'ඉඳුරාම බඳවා ගැනීම - 2025/01 නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරින්/ නිලධාරිනියන්'** යනුවෙන් සටහන් කළ යුතුයි. මීට අමතරව සියලු අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය ඔස්සේද අයදුම්පත් යොමු කළ යුතු අතර ඒ සඳහා **www..navy.lk /joinus** වෙබ් අඩවියට පිවිසිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබෙන අතර වැඩි විස්තර දුරකතන අංක 011-7195120/ 011-7195154 /0760275685 මඟින් ද ලබාගත හැක.

*ආ.* රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්) නියුතු අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ සිවිල් ආයතනයේ) මඟින් ඉදිරිපත් කළ යුතු ය.

*ඈ.* සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, **ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.**

(1) උප්පැන්න සහතිකය;
(2) ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත;
(3) අයදුම්කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/ උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන/ උපාධි සහතික;
(4) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය;
(5) මාස 06ක් ඇතුළත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(6) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;
(7) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතු ය);
(8) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

*ඇ.* **අයදුම්පත් යොමු කිරීමේදී සහ නියම කරන ලද අවස්ථාවන් හී දී මෙම ලියකියවිලි හා ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ/ අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.**

*ඉ.* වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතු ය.

*ඊ.* අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

**13**. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/ අපේක්ෂිකාව තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

**14**. **තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ;**

*අ.* ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. එයින් සමත් වනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පසුව ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට පෙර වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, එයින් සමත් වන සියලුම අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* දක්වා ඇති පරිදි උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/ අයදුම්කාරිනියකගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද, නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ ඇය ගැන සලකා බලනු ලැබේ. මූලික වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබයි (සංශෝධනවලට යටත්ව).

*ආ.* ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා; (සංශෝධනවලට යටත්ව)

| *ඉසව්ව* | *වාර ගණන* | | *කාලය* | |
|---|---|---|---|---|
| | *පිරිමි* | *කාන්තා* | *පිරිමි* | *කාන්තා* |
| **මීටර් 1600 දිවීම** | - | - | මිනිත්තු 09 | මිනිත්තු 11 |
| Push ups | 12 හෝ ඊට වැඩි | 08 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |
| Sit ups/Curl ups | 10 හෝ ඊට වැඩි | 07 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |

*ඇ.* ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සහ සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය. මෙම වෛද්‍ය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් ඉදිරි සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලබයි, එම පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් බඳවාගනු ලැබේ.

*ඈ.* බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

*ඉ.* සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය WhatsApp පණිවිඩයක් මගින් පමණක් දැනුම් දෙන අතර, කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

*ඊ.* මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

*උ.* අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද, එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම, එම අයදුම්කරු/ අයදුම්කාරිනිය නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේ ය.

*ඌ.* අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

*එ.* සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

**15.** ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉදුරාම නිලධාරින්/ නිලධාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතුවන අතර, ජාතික ආරක්ෂාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවා අවශ්‍යතාවයන් අනුව ඉහත ශාරීරික සුදුසුකම්, අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

*සටහන -* මෙම *ගැසට්* නිවේදනය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**බීඒකේඑස්පී බානගොඩ,**
ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
තැ.පෙ. 593,
බත්තරමුල්ල.

## ශ්‍රී ලංකා නිත්‍ය සහ ස්වේච්ඡා නාවික හමුදාවේ ඉදුරාම නිලධාරීන්/ නිලධාරිනියන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත

පුරවැසිභාවය: ……………………………………………………………………………………………………..………..……..………..
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

ඉල්ලුම් කරන තනතුර: ……………………………..……………………………………………………………..………..……..………..

සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව): ………………………………………………………………….………..……..………..

ජාතික හැඳුනුම්පත් අංකය: …………………………………………………………………………………..………..……..………..

ස්ථිර ලිපිනය: ……………………………………………………………………………………………………..………..……..

තැපැල් ලිපිනය: ……………………………………………………………………………………………..………..……..………..

විද්‍යුත් ලිපිනය: ………………………………………………………………………………………......………..……..………..

උපන් දිනය: ……………………………………………………………………………………………..………..……..………..

වයස : අවුරුදු ................. මාස .................. දින .................... (2026 ජනවාරි මස 30 දිනට)

උස ...................……......(සෙ.මී/අඟල්) පපුව (පිරිමි) ...................……...... (සෙ.මී/අඟල්) බර .......……....……......(කි.ග්‍රෑ.)

ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය: ……………………………………………………………..………..……..………..…

දිස්ත්‍රික්කය: ………………………………………………………………………………………………..……………………

ඡන්ද කොට්ඨාසය: ………………………………………………………………………………..........……………………..…

ග්‍රාම නිළධාරී කොට්ඨාසය: …………………………………………………………………………..……………………..…

දුරකථන අංකය: ……...…………....……...… WhatsApp අංකය ………..…......................…...……………………….……...

විවාහක/ අවිවාහක බව: …….………………………………………………………………………..……………………

ස්ත්‍රී/ පුරුෂ භාවය: …………………………………………………………………………..………..……..………..

අධ්‍යාපනය ලැබූ පාසල්: ……………………………………………………………………...........………..……..………..…

……………………………………………………………………………………………...............………..……..………..

උපාධිය/ උසස් අධ්‍යාපනය පිළිබඳ විස්තර

| උපාධිය/ උසස් අධ්‍යාපන ආයතනයේ නම | ලබාගත් ආයතනය | ලබාගත් වර්ෂය | පන්ති සාමාර්ථයන් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |

අධ්‍යාපනය ලැබූ පාසල් පිළිබඳ විස්තර

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස (සා.පෙළ)<br>අ.පො.ස (උ.පෙළ)<br>වෙනත් | | |

<u>පාසලෙන් / විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර</u>

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා<br><br>මව | | | |

ඉල්ලුම් කරන අංශය සඳහා ඇති විශේෂ සුදුසුකම්: ……………………………………………………………….........................
...................................................................................................................................................................
...................................................................................................................................................................

ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න):
……………………………………………………………………………………………………………………...
...................................................................................................................................................................

පාසලේ හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමඟ විස්තර දක්වන්න):
……………………………………………………………………………………………………………………...
...................................................................................................................................................................
...................................................................................................................................................................

සන්නද්ධ සේවා/ ස්වේච්ඡා බළ සේනාවේ/ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය:
……………………………………………………………………………………………………………………...

ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේනම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න:
……………………………………………………………………………………………………………………...
...................................................................................................................................................................
...................................................................................................................................................................

සිවිල් හෝ යුධ අධිකරණයකදී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේද? එසේනම් විස්තර සඳහන් කරන්න:
……………………………………………………………………………………............................................………...……...………..

චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

අයදුම්කරු/ අයදුම්කාරිනිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය.

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් ලබාදී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාපිළිවෙල හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

.................................. ............................................................
දිනය අයදුම්කරුගේ/ අයදුම්කාරිනියගේ අත්සන.

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් (සුදුසුකම්වලට අදාළ ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත් ද සමඟ) ලිපිනයට යොමු කරන්න.

ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්)
නාවික හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
තැ.පෙ. 593,
බත්තරමුල්ල.

සම්බන්ධතා විස්තර -
විද්‍යුත් තැපැල: nhqssorec@gmail.com දුරකථන 0117195154, 0117195120
ජංගම දුරකථන: 0760275685

01-107

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අංශය

**රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීම - 2025**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, දේශීය වෛද්‍ය අංශය යටතේ ඇති රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරී සේවා ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරේ **2025.01.01** දිනට පවතින පුරප්පාඩු 02 සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා අනුකමිටුවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් එවිය යුතු අවසාන දිනට හෝ ඊට පෙර ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අංශය, අංක 26, 3 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහල කෙළවරේ "රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම 2025" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**(අ) අයදුම්පත් එවිය යුතු අවසාන දිනය: 2026.01.30 දින වේ.**

***සටහන:*** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් භාරගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට, මෙම නිවේදනයේ 5 ඡේදයෙහි සඳහන් සියළුම සුදුසුකම් සපුරා ඇති මීට පෙර සිදු කරන ලද බඳවා ගැනීමෙන් පසුව මෙතෙක් රාජ්‍ය සේවයේ පත්වීම් නොලද , හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නෛතිකව තහවුරුවන වෛද්‍ය නිලධාරීන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමෙන් පසු උසස් කිරීම් සිදු කරනුයේ රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමේ පරිපාටියෙහි දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට අනුකූලවය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි විධිවිධාන අනුව මෙම පත්වීම් භාරගත් දින සිට වර්ෂ පහක් ගතවීමට පෙර රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත් බව සනාථ කළ යුතු වේ. තවද මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලන ලද්දේ ඉංග්‍රීසි භාෂාවෙන් නම් අභිමතය පරිදි රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල හෝ දෙමළ යන භාෂා දෙකෙන් එක් භාෂාවක ප්‍රවීණතාවය පත්වීමේ දින සිට වසර 03 ක් එනම් පරිවාස කාලය ඇතුලත ද, අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත ද, ලබා ගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.09.17 දිනැතිව අනුමත කරන ලද 2020.11.05 දිනැති සංශෝධිත රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමේ පටිපාටියෙහි ඇතුළත් නියමයන් සහ කොන්දේසිවලට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, මෙම පත්වීම යටත් වේ.

03. වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව මාසිකව,

රු. 91,750-3 x 2,400-7 x 2,420-2 x 2,940-16 x 3,900- රු. 184,170 (SL 2- 2025)

04. වයස් සීමාව : අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. සුදුසුකම් :

5.1 අධ්‍යාපන සුදුසුකම් :

ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටක පිහිටි විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර 5 ½ කට නොඅඩු පූර්ණ කාලීන හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :

හෝමියෝපති වෘත්තිකයකු වශයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය 2025 වර්ෂය සඳහා යාවත්කාලීන කර තිබීම.

5.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.4 වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

iii. සේවයට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළි ගනු ලැබීමට අයදුම්කරු විසින් රජයේ රෝහලේ වෛද්‍ය නිලධාරී සේවා ගනය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි 7.2.2 ඡේදයේ සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර සුදුසකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

6. සම්මුඛ පරීක්ෂණය :

6.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව මඟින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

6.2 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය යෝග්‍යතා ඇගයිමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය පහත පරිදි වේ.

01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 30

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි විධිවිධාන අනුව

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලබන උපාධියක් ;

*හෝ*

2. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් උපාධියක්

***සටහන :*** තනතුරේ ස්ථිර කිරීමට හෝ උසස්වීම් ප්‍රදානය කිරීමට පෙර ඒ ඒ උපාධියේ සත්‍යතාවය පිළිබඳව අදාළ විශ්වවිද්‍යාලයෙන් සත්‍යාපනය කර ගත යුතුවේ.

* වෛද්‍ය විද්‍යාවට හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධිත

| | | |
|---|---|---|
| (අ) | දර්ශනපති උපාධිය (Ph.D) | - ලකුණු 30 |
| (ආ) | දර්ශනවේදී උපාධිය (M.Phill) | - ලකුණු 25 |
| (ඇ) | විද්‍යාපති උපාධිය (MSc) | - ලකුණු 20 |
| (ඈ) | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 15 |
| (ඉ) | විද්‍යාවේදී උපාධිය (BSc) | - ලකුණු 10 |
| (ඊ) | ඩිප්ලෝමා පාඨමාලාව (මාස 06 හෝ ඊට වැඩි) | - ලකුණු 05 |
| (උ) | සහතිකපත්‍ර පාඨමාලා | - ලකුණු 03 |

සටහන 2: ඉහත අංක 5.1 අධ්‍යාපන සුදුසුකම් යටතේ (මූලික සුදුසුකම) අදාළ කරගනු ලැබූ අධ්‍යාපන සුදුසුකම් සඳහා මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ හෝමියෝපති නොවන වෙනත් වෛද්‍ය ක්‍රම පිළිබඳ පාඨමාලා වන බටහිර ඖෂධවේදය (Pharmacy) සායනික මනෝවිද්‍යාව (Clinical Psychology), භෞතික චිකිත්සවේදය (Physiotherapy) වැනි ක්ෂේත්‍ර අදාළ වේ.

02. අතිරේක වෘත්තීය සුදුසුකම් (උපරිම ලකුණු 30)

(අ) වසරකට ලකුණු 05 බැගින් වසර 06 ක උපරිම වෘත්තීය පළපුරුද්ද කාලයක් සඳහා රෝහලක ආයතනයක හෝ සායනයක වෘත්තීමය (වෛද්‍ය චිකිත්සා අංශයෙන්) පළපුරුද්දක් ලබා තිබීම සනාථ කිරීමට ප්‍රතිකාර කළ රෝගී නාමලේඛන සහ එම ආයතනයන්හි සේවය කළ බවට අදාළ ආයතනයේ නිල මුද්‍රාව සහිත ආයතන ප්‍රධානියාගෙන් හෝ පෞද්ගලිකව පවත්වාගෙන ගිය ආයතනයක් නම් අදාළ ආයතනය පවත්වාගෙන යනු ලැබූ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය මඟින් සනාථ කළ යුතු ය. අතිරේක වෘත්තීය සුදුසුකම් යටතේ, වෘත්තිය පළපුරුද්ද ලබා ගෙන ඇත්තේ පෞද්ගලික අංශය යටතේ

නම්, එය ලබා ඇත්තේ රජයේ අනුමත ආයතනයක් මගින් ද යන වග සනාථ කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

03. වෛද්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන සඳහා (උපරිම ලකුණු 35)

හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව පළකර ඇති ජාත්‍යන්තර/ජාතික මට්ටමේ සඟරා/පොත්/ප්‍රකාශන පර්යේෂණ යනාදිය සඳහා (පර්යේෂණ/ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කර ගත යුතු නිර්ණායක (මේ සමඟ අමුණා ඇති - ඇමුණුම 01 පරිදි) සහ ඒ අනුව ලකුණු ලබා දිය යුතු ආකාරය (මේ සමඟ අමුණා ඇති - ඇමුණුම 02 හි සඳහන් කරුණු සැලකිල්ලට ගෙන, මෙම බඳවා ගැනීමට අදාළ පරිදි ලකුණු ලබා දෙන ආකාරයට)

(අ) ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සඳහා (එකකට ලකුණු 7 බැගින් උපරිම ලකුණු 14)

(ආ) ජාතික මට්ටමේ සඟරා / ප්‍රකාශන / පුවත්පත්හි පළකළ ලිපි සඳහා (එකකට ලකුණු 5.25 බැගින් උපරිම ලකුණු 21)

*සටහන -* කර්තෘන් කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් පළ කරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුවන්ට ලකුණු ලබා දෙනු ලැබේ.

04. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය සඳහා ලකුණු ලබා දීමේ දී, නායකත්වය, ආකල්ප, කුසලතාවය, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා යන නිර්ණායක යටතේ සලකා බලා උපරිම ලකුණු 05ක් සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දෙනු ලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ සුදුසුකම් සනාථ කරමින් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සනාථ කරන සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉල්ලා සිටින විටෙක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතු ය. (සුදුසුකම් සනාථ කරන සත්‍ය පිටපත් කළ ලේඛන අයදුම්පතට අමුණා එවීම අනිවාර්ය වේ)

i. උප්පැන්න සහතිකය;
ii. ජාතික හැඳුනුම්පත;
iii. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය;
iv. උපාධි සහතිකය;
v. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය;
vi. වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික.

08. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්පත්‍රය සෙ.මී. 22x29 ප්‍රමාණයේ A4 වර්ගයේ කඩදාසියක සකස් කළ යුතු අතර අංක 01 සිට අංක 08 දක්වා ශීර්ෂ පළමුවන පිටුවට ද අංක 09 සිට අංක 10 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද වන සේ ගෙන සකස් කර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

09. සාවද්‍ය තොරතුරු සැපයීම.

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10. පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කිරීම සම්බන්ධ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව සතු ය.
(රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි)

ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 02 දින.

රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරි සේවා ගණයේ ප්‍රාථමික ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම

1. i. (අ) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

..........................................................................................................................

(ආ) මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්) :

..........................................................................................................................

ii. (අ) මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

..........................................................................................................................

(ආ) මුලකුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/ දෙමළෙන්) :

..........................................................................................................................

2. i. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ලිපි එවනු ලබන්නේ මෙම ලිපිනයට) :

..........................................................................................................................
..........................................................................................................................

ii. ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :

..........................................................................................................................
..........................................................................................................................

iii. දුරකථන අංක : ජංගම : ……………… ස්ථාවර : ………………………

03. i. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

ii. 2023 .12.31 දිනට වයස : අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

04. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී: ☐ පුරුෂ: ☐

05. විවාහක ද / අවිවාහක ද : විවාහක: ☐ අවිවාහක: ☐

06. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

.......................................................................................

07. ස්ථිර පදිංචි ස්ථානය අයත්

i. පළාත් සභාව: ..............................................................................

ii. දිස්ත්‍රික්කය: ...............................................................................

iii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ....................................................

08. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

09. අධ්‍යාපන සුදුසුකම් :

I. උපාධියේ නම: ..........................................................................................

II. විශ්වවිද්‍යාල / ආයතනය: ..............................................................................

III. උපාධි වලංගුවන දිනය: ..................................................................................

IV. පන්තිය: ....................................................................................................

V. උපාධිය සම්පූර්ණ කළ මාධ්‍ය: ..........................................................................

VI. ප්‍රායෝගික පුහුණුව ලැබූ කාල සීමාව: ..............................................................

10. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය පිළිබඳ විස්තර

I. ලියාපදිංචි අංකය: ....................................................................................

II. වර්ෂය: .......................................................................................................

මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අදාළ ලේඛනවල සහතික කරන ලද පිටපත් මේ සමඟ අමුණා ඇති බවත් මම මෙයින් සනාථ කරමි. මා රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීමෙන් පසු මෙහි ඇතුළත් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව පත්වීම් බලධාරියාට අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද කිසියම් වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් ඉවත් කිරීමට ද යටත් වන බව මම දනිමි.

................................................ ...................................................,

දිනය අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

අයදුම්කරුගේ අත්සන සහතික කරමි.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ..................................................................(සම්පූර්ණ නම ) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ..................................................... දින ඔහුගේ/ ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

................................................ ...................................................,

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව

ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත් ඔහු / ඇයගේ වැඩ සහ හැසිරීම ...................................... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු / ඇය මුදාහැරිය හැකිය / නොහැකිය.

................................................ ...................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම - 01

<u>පර්යේෂණ/ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කර ගත යුතු නිර්ණායක</u>

I. ප්‍රකාශන :

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක්කර ඇති අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

(ආ) සමුළු පත්‍රිකා / උද්ධෘත / අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන සභාවක් , සම්මන්ත්‍රණ අධ්‍යන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදාගත් වාර්තා

II. කර්තෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්වය ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ලැබේ. අයදුම්කරුගේ දායකත්වය පළමු කර්තෘන් තිදෙනා අතර තිබේ නම් උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ඇත.

III. එකම දත්ත / පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝ දුරට සමාන නිගමනයන්ට එළැඹි ඇති ප්‍රකාශන වෙන් වෙන් ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවක දී ලකුණු ලබා දීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

IV. සම්මුඛ පරීක්ෂණයක දී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි / පශ්චාත් උපාධි පුහුණුවෙහි කොටසක් ලෙස පළකරන ලද ප්‍රකාශන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

V. අයදුම්කරු විසින් ප්‍රමුඛතාවය අනුපිළිවෙලට පෙළගස්වන ලද ප්‍රකාශන / පර්යේෂණ ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය. (ඉහළම ප්‍රමුඛතාවයේ සිට ප්‍රමුඛතාවය අඩුවන පිළිවෙලට)

ඇමුණුම 02

<u>හෝමියෝපති වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ ලකුණු පටිපාටිය</u>

( අ) ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල ක්ෂේත්‍රයට අදාළ එක් පර්යේෂණයක් සහ ප්‍රකාශනයක්

*හෝ*

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

*හෝ*

සමුළු පත්‍රිකා/ උද්ධෘත/ අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනාවක්

*හෝ*

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදා ගත් වාර්තාවක් (එකකට ලකුණු 7 බැගින් උපරිම ලකුණු 14)

අ. 1 . කර්තෘන් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන්

- ❖ Author List (1-3) - 4 Marks
- ❖ Author List < 3 - 3 Marks

(ආ) ජාතික මට්ටමේ සඟරා / ප්‍රකාශන / පුවත්පත්හි පළකළ ලිපි සඳහා (එකකට ලකුණු 5.25 බැගින් උපරිම ලකුණු 21)

| | | |
|---|---|---|
| 5.25 Marks | I. Author List (1-3) | - 3 Marks |
| | II. Abstract and Poster Presentation | - 2.25 Marks |

01 - 136

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**<u>කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (වාරිමාර්ග) III ශ්‍රේණිය හා තාක්ෂණ සහායක (යාන්ත්‍රික) III ශ්‍රේණිය තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025</u>**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය , විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **<u>2026 අප්‍රේල් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී</u>** පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

- ❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/E.B.Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **<u>2026 ජනවාරි මස 12 දින පෙ.ව.9.00ට විවෘත වන අතර 2026 පෙබරවාරි 06 දින ප.ව. 9.00 ට අවසන් වේ.</u>**

- ❖ දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

- ❖ අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**1.0 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :**

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01 | තාක්ෂණ සහායක (වාරිමාර්ග) | 13 | III ශ්‍රේණිය |
| 02 | තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | 08 | III ශ්‍රේණිය |

1.1. තනතුරුවල රාජකාරි ස්වභාවය

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| 1. | තාක්ෂණ සහායක (වාරිමාර්ග) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාරවරයකුගේ අධීක්ෂණය යටතේ පවරනු ලබන පහත කාර්යයන්,<br>• ක්ෂේත්‍රයේ නව ඉදිකිරීම්, වැඩි දියුණු කිරීම් හා අලුත් වැඩියා කිරීම් සඳහා වන වැඩ පරීක්ෂා කිරීම.<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රමිතීන්ට අනුව එම කටයුතුවල දී පවරනු ලබන වගකීම් ඉටු කිරීම.<br>• අදාළ ක්ෂේත්‍රයේ වාරිමාර්ග හා උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීම යනා දී ව්‍යාපාරවල මෙහෙයුම් හා නඩත්තු වැඩ පරීක්ෂා කිරීම.<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වාරිමාර්ග, උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීමේ හා කරදිය වැළැක්වීමේ ව්‍යාපාර, ගොඩනැගිලි, පාරවල් සහ ඒවාට අයත් රක්ෂිත පිළිබඳව අවධානයෙන් සිටීම සහ ආරක්ෂා කිරීම. |
| 2. | තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | යාන්ත්‍රික වැඩපලට අලුත්වැඩියාව සඳහා රැගෙන එන යන්ත්‍ර හා වාහන භාර ගැනීම.<br>යාන්ත්‍රික අංශයට අනුයුක්ත කනිෂ්ඨ සේවකයන්ගේ රාජකාරි අධීක්ෂණය. |

**2. බඳවා ගැනීමේ ක්‍රමය :**

2.2. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාව හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.

2.4. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ මාර්ගගතව හෝ ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

3. **වැටුප් පරිමාණය -** මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන I අනුව රු. 50,090-10X540-11X630-10X1,010-10X1,190- 84,420/- වේ. ( MT1 -2025)

4. **සේවා ගණය -** කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩ 3

4.1 ශ්‍රේණි - III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය

**5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

5.1. මෙම පත්වීම ස්ථිරය. එතකුදු වුවත් ඔබ වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

5.2. මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

5.3 තාක්ෂණ සහායක III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළ ලබාගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන හා එයට වරින්වර කරනු ලබන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම යටත් වේ.

**6. වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

❖ ඒ අනුව 2008.02.06 දිනට හෝ ඊට පෙර හා 1991.02.06 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

**7. අවශ්‍ය සුදුසුකම් :**

7.1. අධ්‍යාපන සුදුසුකම් - තාක්ෂණ සහායක (වාරිමාර්ග) / තාක්ෂණ සහායක (යාන්ත්‍රික)

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

7.2. වෘත්තීය සුදුසුකම්:-

**තාක්ෂණ සහායක (වාරිමාර්ග) -**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධකාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (සිවිල්) පාඨමාලාව සමත් වී අදාළ සහතිකය (NCT-civil) ලබා ගෙන තිබීම හෝ ඉහත 7.1 අධ්‍යාපන සුදුසුකම් මත ආධුනික තාක්ෂණ සහායක (වාරිමාර්ග) වශයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට බඳවා ගෙන වාරිමාර්ග පුහුණු ආයතනයක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා ජාතික තාක්ෂණ සහතිකය සිවිල් (වාරි තාක්ෂණ) (NCT-civil) ලබා තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම.

**තාක්ෂණ සහායක (යාන්ත්‍රික)**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධකාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (යාන්ත්‍රික) පාඨමාලාව සමත් වී අදාළ සහතිකය (NCT-Mechanical) ලබා ගෙන තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම.

7.3. කායික සුදුසුකම්: - සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

7.4. වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**8. විභාග පරිපාටිය:-**

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

8.1 විභාගය සඳහා වන විෂය නිර්දේශය:-

<u>තාක්ෂණ සහායක (වාරිමාර්ග) III ශ්‍රේණිය</u>

1. බුද්ධි පරීක්ෂණය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මූලික ගණිතමය දැනුම හා මූලික සිවිල් ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

<u>තාක්ෂණ සහායක (යාන්ත්‍රික) III ශ්‍රේණිය</u>

1. බුද්ධි පරීක්ෂණය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවත්,ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මූලික ගණිතමය දැනුම හා මූලික යාන්ත්‍රික ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහාවන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

**9. අයදුම් කිරීමේ ක්‍රමය:**

9.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත් හා වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-Mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුරට ද, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරට ද යන්න අදාළ ස්ථානයෙහි (√) සලකුණ මඟින් පැහැදිලිව සලකුණු කිරීම අනිවාර්ය වේ.

9.3 අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දෙනු නොලැබේ.

9.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සඳහන්

කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළග තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.5 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

9.6 ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.7 සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

***10.*** ***විභාග ගාස්තු :***

❖ <u>විභාග ගාස්තුව රු. **600/-** කි</u>. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත සඳහන් ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the facility of internet transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

**11. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව:**

11.1 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එසේම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. තව ද, විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

12.1 අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

**13. පොදු කරුණු:**

13.1 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

13.2 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

13.3 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**ආචාර්ය. (ඉංජි.) කිත්සිරි වැලිගෙපොලගේ,**
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

2025 දෙසැම්බර් මස 15 දින
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍ර

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා
තාක්ෂණ සහායක (වාරිමාර්ග) හා තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන
**විවෘත තරග විභාගය - 2025**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
   සිංහල - 1
   දෙමළ - 2
   (අදාළ කොටුව තුළ ලියන්න)

2. අයදුම් කරනු ලබන තනතුරු නාමය: 1. ........................................
   2. ........................................

3. මුලකුරු සමඟ නම (මුලකුරු අගට යොදා) : (මයා/මිය/මෙනෙවිය)

   සිංහලෙන් / දෙමළෙන් : ........................................
   ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) : ........................................
   (උදා. PERERA, A.B.C)

3.1. සම්පූර්ණ නම :

.........................................................................................................................................

.........................................................................................................................................

ඉංග්‍රීසි (කැපිටල් අකුරින්):

.........................................................................................................................................

.........................................................................................................................................

4. ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

5. ස්ත්‍රී /පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ලියන්න)

පුරුෂ - M
ස්ත්‍රී - F

6. ස්ථිර ලිපිනය : (පැහැදිලි අකුරින්) :

.........................................................................................................................................

.........................................................................................................................................

ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :

.........................................................................................................................................

.........................................................................................................................................

6.1. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :

.........................................................................................................................................

ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :

.........................................................................................................................................

7. දුරකතන අංකය :

ස්ථාවර ................................ ජංගම ....................................

8. පදිංචිය :

8.1. පදිංචි දිස්ත්‍රික්කය : ...............................................................

8.2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ............................................................

9. විවාහක / අවිවාහක බව :
අවිවාහක - 1 , විවාහක - 2

10. උපන් දිනය :

වර්ෂය : | | | | | | මාසය: | | | දිනය: | | |

8.1. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2026.02.06 දිනට ) වයස :

අවුරුදු: | | | මාස: | | | දින: | | |

11. අධ්‍යාපන සුදුසුකම් :

*11.1. අ.පො.ස (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

**පළමු වන වර**

I. විභාගයේ වර්ෂය හා මාසය : ........................................................

II. විභාග අංකය : ........................................................

III. ප්‍රතිඵල :

| | *විෂයය* | *ශ්‍රේණිය* | | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

11.2. අ.පො.ස (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

**දෙවන වර**

I. විභාගයේ වර්ෂය හා මාසය : ........................................................

II. විභාග අංකය : ........................................................

III. ප්‍රතිඵල :

| | *විෂයය* | *ශ්‍රේණිය* | | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

10. *වෘත්තීය සුදුසුකම් :*

| *හදාරා ඇති පාඨමාලාව* | *පිරිනමනු ලැබූ ආයතනය* | *හදාරා ඇති කාල සීමාව* | *සහතික පත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |

අදාළ සහතිකයේ පිටපතක් අමුණන්න.

13. අයදුම්කරුගේ සහතිකය :

.................................................................................................. වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබ හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත් සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.මා මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම් වල රාජකාරී කිරීමට එකඟ වෙමි.

| | |
|---|---|
| ................................................ | ..................................................., |
| දිනය | අයදුම්කරුගේ අත්සන. |

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මයා/මිය/මෙනෙවිය , මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ..............................වැනි දින මා ඉදිරිපිටදී ඉහත 13 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

| | |
|---|---|
| ................................................ | ..................................................., |
| දිනය | සහතික කරන නිලධාරියාගේ අත්සන. |

සහතික කරන නිලධාරියාගේ නම : ....................................................
තනතුර : ....................................................
ලිපිනය : ....................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානියාගේ සහතිකය : (දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

................................................ මයා/මිය/මෙනෙවිය .................................................සේවයේ නියුතු ............................... ......................... තනතුර දරණ නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු /ඇය තෝරා ගනු ලැබුවහොත්, .......................................සේවයෙන් ඔහු/ ඇය මුදා හැරිය හැකි /නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

| | |
|---|---|
| ................................................ | ................................................... |
| දිනය | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව. |

01 - 79

## මුදල් කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

මුදල් කොමිෂන් සභාවේ පවතින ඉහත තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 මැයි මස කොළඹ දිස්ත්‍රික්කයේදී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

- ❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications - Recruitment Exams/E.B.Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජනවාරි මස 12** දින පෙ.ව. **9.00** ට විවෘත වන අතර **2026 පෙබරවාරි මස 06** වැනි දින රාත්‍රී **9.00** ට අවසන් වේ.
- ❖ දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.
- ❖ අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

1.0. **බඳවා ගැනීමේ සුදුසුකම් :**

අයදුම්කරුවන් විසින් තනතුරට බඳවා ගැනීමේ සුදුසුකම් සියල්ල මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**1.1. සාමාන්‍ය සුදුසුකම් :**

1.1.1. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;

1.1.2. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;

1.1.3. යම් ආගමක / ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

1.1.4. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**1.2. කායික සුදුසුකම් :**

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

**1.3. වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**1.4. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

1.4.1. **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III ශ්‍රේණිය (විවෘත)**

1.4.1.1. **අධ්‍යාපන සුදුසුකම් :**

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිතය විෂය ධාරාවෙන් ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම;

*සහ*

- සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

1.4.1.2. **වෘත්තීය සුදුසුකම් :**

ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය.

- මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ;

*හෝ*

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්);

*හෝ*

- අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු පාඨමාලාව (සිවිල්);

*හෝ*

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);

*හෝ*

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම (සිවිල්) ;

*හෝ*

- රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (සිවිල් අංශයෙන්) ;

*හෝ*

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම (සිවිල් අංශයෙන්).

1.4.2. **පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) :**

1.4.2.1. **අධ්‍යාපන සුදුසුකම් :**

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිතය විෂය ධාරාවෙන් ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම;

*සහ*

- සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

1.4.2.2. **වෘත්තීය සුදුසුකම් :**

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව (සිවිල් ඉංජිනේරු) සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම;

*හෝ*

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පාඨමාලාව (සිවිල්) සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

*හෝ*

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් (සිවිල් අංශයෙන්) ලබා තිබීම.

2.0. **බඳවා ගැනීමේ ක්‍රමය :**

**2.1.** ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී III ශ්‍රේණියට හා පුහුණු කිරීමේ ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීමේදී III ශ්‍රේණියට පළමුව බඳවා ගැනීම සිදු කරනු ලබන අතර, III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවකු නොමැති විට පමණක් පවතින පුරප්පාඩුව සඳහා පුහුණු කිරීමේ ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවකු බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**2.2.** ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මූළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමට පමණක් සිදු කරනු ලබන සාමාන්‍ය සම්මුඛ

පරීක්ෂණයකින් අනතුරුව පුරප්පාඩුව පවතින තාක්ෂණ නිලධාරි තනතුර (01) සඳහා සුදුස්සකු තෝරා ගනු ලැබේ.

**2.3.** ලිඛිත විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර සියලුම ප්‍රශ්නවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

**2.4. ලිඛිත විභාගය :**

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

**2.5. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්යයන් ඒ සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයුම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙළ පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

**2.6.** ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා වන ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

**2.7.** ඉහත තාක්ෂණ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතු ය.

**2.8.** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය, මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පත් කරනු ලබන අතර, මෙම පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර, සුදුසුකම් පරීක්ෂා කිරීමක් පමණක් සිදු කෙරේ.

**2.9.** මුදල් කොමිෂන් සභාවේ ලේකම්ගේ එකඟතාව ලැබුණු පසු විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයන් වෙත ප්‍රතිඵල දන්වා යැවීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් පියවර ගනු ඇත.

3.0. **පුහුණු කාල සීමාව අවසානයේ දී III ශ්‍රේණියට බඳවා ගැනීම :**

**3.1.** විවෘත ධාරාව මඟින් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරු අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මුදල් කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**3.2.** පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වුවහොත් මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට ඔහුට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

4.0. **මාසික වැටුප් පරිමාණය හෝ දීමනාව :**

**4.1.** අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව තාක්ෂණ නිලධාරි III ශ්‍රේණියේ තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය,

රු.52,250 - 800 x 10 - 1119 x 11 - 1320 x 10 - 1350 x 10 - රු. 100,040/= (MN-3 2025) වේ.

මෙයට අමතරව රජයේ නිලධාරීන්ට රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද මෙම තනතුර දරන්නාට හිමි වනු ඇත.

**4.2.** පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු කාලය තුළ ඉහත කී, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි උපලේඛන VI අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

5.0. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

**5.1.** රාජ්‍ය සේවයේ පත් කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටි රීතිවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද සහ රාජ්‍ය

සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානවලට ද ඒවාට වරින් වර කරන ලද සහ ඉදිරියේ දී කරනු ලබන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවන් මෙම තනතුරට පත් කරනු ලැබේ.

**5.2.** ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි III ශ්‍රේණියේ තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්ව) පත්වීම්ලාභියා විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර, රජය විසින් වරින් වර නියම කරනු ලබන ආකාරයට පත්වීම්ලාභියා, ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

**5.3.** ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි III ශ්‍රේණියේ පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන අතර, පත්වීම්ලාභියා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර තුනක් (03) ඉකුත් වීමට පෙර රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. එම තනතුරට බඳවා ගෙන වසර තුනක් (03) ගත වීමට පෙර පළමු වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

**5.4.** ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරියා විසින් මුදල් කොමිෂන් සභා කාර්යාල ගොඩනැගිල්ල හා එහි විදුලි පද්ධතිය, වායු සමීකරණ පද්ධති, මළ අපවහන පද්ධතිය, විදුලි සෝපාන, ජලනල පද්ධතිය, ගිනි නිවන පද්ධතිය, විදුලි ජනක යන්ත්‍රය නඩත්තුව හා සුපරීක්ෂණය, ගොඩනැගිලි භූමිය, කාණු පද්ධතිය හා ජලය බැස යාම සුපරීක්ෂණය හා නඩත්තුව සහ අවස්ථානුකූලව පවරනු ලබන තනතුරට අදාළ වෙනත් රාජකාරි කටයුතු ඉටු කරනු ලැබිය යුතු ය.

6.0. **අයදුම් කිරීමේ ක්‍රමය**

**6.1.** මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටිපණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**6.2.** අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි III ශ්‍රේණියට ද පුහුණු කිරීමේ ශ්‍රේණියට ද යන්න අයදුම්පතෙහි අදාළ ස්ථානයෙහි පැහැදිලිව සලකුණු කිරීම අනිවාර්යය වේ.

**6.3.** අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

**6.4.** *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටිපණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**6.5.** අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

**6.6.** සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

7.0. **විභාග ගාස්තු**

❖ විභාග ගාස්තුව රු.600/= කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පත් මගින් (Any Bank Credit Card),
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පත් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions),
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon),
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන*

**7.1.** ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

**7.2.** ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

**7.3.** විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

8.0. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාව**

**8.1.** විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු රියදුරු බලපත්‍රය.

එසේම, විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතා සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ. තව ද විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

9.0. **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්**

**9.1.** අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

10.0. **පොදු කරුණු**

**10.1.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

**10.2.** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් තීරණය කරනු ඇත.

**10.3.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**ජේ.ටී.එම්.යූ.ඩී.බී. තෙන්නකෝන්,**
ලේකම්,
මුදල් කොමිෂන් සභාව.

2025 දෙසැම්බර් මස 18 වැනි දින,
අංක 03,
සරණ මාවත,
රාජගිරිය.

01 - 94

**පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත**

ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටම
(NVQ4) -2026

**ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) /ක්ෂේත්‍ර සහායක (කෘෂිකාර්මික ව්‍යාප්ති) පුහුණු පාඨමාලා**
**හෝමාගම (පිරිමි) සහ වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන් හි පැවැත්වේ**

**01.** මෙම පුහුණු පාඨමාලා සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම සඳහා, බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙනි. මෙම පාඨමාලාව හෝමාගම (පිරිමි) සහ වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන්හි පැවැත්වේ. කෘෂිකාර්මික අංශයේ රැකියා අවස්ථා සඳහා මෙන්ම ස්වයං රැකියා පදනමක් මත ක්‍රියාත්මක වීමට ඉදිරිපත් වන්නන් සඳහා ඉලක්ක කර ඇත.

**02.** <u>පාඨමාලාවන්හි ස්වභාවය</u>

- ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලෙස පවත්වනු ලබන මෙම පාඨමාලා සාර්ථකව නිම කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.
- තව ද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 මට්ටමේ සහතික ලබා ගැනීමට ද අවස්ථාව ලැබේ.
- පාඨමාලාවන්හි අන්තර්ගත විෂයයන් පහත පරිදි වේ.

➢ **ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) NVQ 4 පාඨමාලාවට අදාළව**

i. A-01S003U01 - කෘෂිකාර්මික මූලධර්ම
ii. A-01S003U02 - වී සහ අනෙකුත් ධාන්‍ය බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම
iii. A-01S003U03 - අනෙකුත් ක්ෂේත්‍ර බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම
iv. A-01S003U04 - උද්‍යාන බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම
v. A-01S003U05 - අස්වනු නෙලීම සහ ප්‍රාථමික සැකසීම
vi. A-01S003U06 - ගොවිපල යන්ත්‍ර, උපකරණ සහ මෙවලම් නඩත්තු කිරීම
vii. A-01S003BU01 - වැඩබිම් සඳහා සන්නිවේදන කුසලතා
viii. A-01S003BU02 - භාෂා සාක්ෂරතාවය සහ ගණිතමය හැකියාව
ix. A-01S003BU03-කණ්ඩායම් වැඩ
x. A-01S003BU04-වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂිත ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම

➢ **ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම ව්‍යාප්ති) NVQ 4 පාඨමාලාවට අදාළව**

i. A-01S003U01 - කෘෂිකාර්මික මූලධර්ම
ii. A-01S003U02 - වී සහ අනෙකුත් ධාන්‍ය බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම
iii. A-01S003U03 - අනෙකුත් ක්ෂේත්‍ර බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම
iv. A-01S003U04 - උද්‍යාන බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම
v. A-01S003U05 -අස්වනු නෙලීම සහ ප්‍රාථමික සැකසීම
vi. A-01S003U06 - ගොවිපල යන්ත්‍ර, උපකරණ සහ මෙවලම් නඩත්තු කිරීම
vii. A-01S003U07 - කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
viii. A-01S003BU01 - වැඩබිම් සඳහා සන්නිවේදන කුසලතා
ix. A-01S003BU02 - භාෂා සාක්ෂරතාවය සහ ගණිතමය හැකියාව
x. A-01S003BU03 - කණ්ඩායම් වැඩ
xi. A-01S003BU04 - වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂිත ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම

- ඉහත විෂයයන් ඔස්සේ පාඨමාලා ඉදිරිපත් කිරීමේ දී නව කෘෂිකාර්මික තාක්ෂණික සංවර්ධනයට අදාළ නවතම සොයා ගැනීම් (උදා: පසු අස්වනු තාක්ෂණය, හරිතාගාර වගා ක්‍රම) ස්වයං රැකියා උපාය මාර්ග (උදා: භූමි දර්ශ ස්ථාපනය, ගොවිපළ ගිණුම්, ගොවිපළ උපකරණ නඩත්තුව හා ට්‍රැක්ටර් යන්ත්‍ර පැදවීම හුරු කිරීම) සහ තොරතුරු සැකසීමේ නව ක්‍රම සඳහා හුරුවක් ලබා දීම ද (උදා: පරිගණක භාවිතය) සිදු කරනු ඇත. එසේම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය සහ කාලීනව බලපවත්වන කෘෂිකාර්මික ප්‍රතිපත්ති පිළිබඳව අවබෝධයක් ද ලබා දෙනු ඇත.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස පෙර කණ්ඩායමේ සිසුන් සඳහා වන සහතිකපත් හා තිළිණ ප්‍රදානෝත්සවය,

සිංහල අවුරුදු උත්සවය හා වාර්ෂික පිරිත් සජ්ඣායනය වැනි කණ්ඩායම් ක්‍රියාකාරී වැඩසටහන් ආදිය සඳහා ද සහභාගී වීමට අවස්ථාව සැලසේ.

- වසරක කාලයකින් සමන්විත පාඨමාලාවේ මුල් මාස 06 මොඩියුල හැදෑරීමටත් ඉතිරි මාස 06 රැකියාස්ථ පුහුණුවටත් යොමු කෙරේ. මොඩියුල හදාරා නිම වූ පසු ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ. තව ද මෙම මොඩියුල කාල සීමාව තුළ අඛණ්ඩ ඇගයීම් ද දිගටම සිදු කෙරේ. මෙම කාල සීමාවේ දී අධ්‍යයන චාරිකා සැලසුම් කර ඇත. ඉන් අනතුරුව තමන් තෝරාගත් විෂය ක්ෂේත්‍රයන් මත බාහිර කෘෂිකර්ම ව්‍යාපාරයක් /ආයතනයක් සමඟ සම්බන්ධ කරන අතර ඒ අනුව කර්මාන්තගත පුහුණුවක් ලබා ගත යුතු ය. සියලුම සිසුන් කර්මාන්තගත පුහුණුව අවසානයේ ඒ පිළිබඳ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීම සහ ඇගයුම් මණ්ඩලයක් ඉදිරියේ ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු ය. එම කාර්යය නිමාවත් සමඟ NVQ 4 අවසාන ඇගයීම් පවත්වනු ඇත. පාඨමාලාවට පැමිණීම 80% සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ. පාඨමාලාව සාර්ථකව නිම කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සහතික පිරිනමනු ලැබේ. එසේ ම මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් NVQ 4 ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) හෝ NVQ 4 ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්මික ව්‍යාප්ති) – තෘතීයික හා වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමට ද අවස්ථාව ලැබේ.

03. **බඳවා ගැනීමේ පරිපාටිය**

**03.1 මූලික සුදුසුකම්**

1. **අධ්‍යාපනික සුදුසුකම්**:- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම ;

*හෝ*

2. අයදුම්පත් කැඳවා අවසන් වන දිනට කෘෂිකර්ම ක්ෂේත්‍රයට සෘජුව සම්බන්ධ NVQ level 3 පාඨමාලවක් (උදා. ක්ෂේත්‍ර සහායක(කෘෂිකර්ම), පැල තවාන් සංවර්ධන සහායක, භූමි දර්ශ සංවර්ධන සහායක,........ ආදී) සාර්ථකව හදාරා නිමකර තිබීම.

❖ අ.පො.ස. (සා.පෙළ)/ අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා කෘෂිකර්ම විෂය හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**03.2 වෙනත් සුදුසුකම්:**

i. සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවා අවසන්වන දිනට වයස අවුරුදු 16 - 25ත් අතර විය යුතු ය.

ii. අයදුම්පත් කැඳවා අවසන් වන දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දේ.

iii. ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

iv. අයදුම්කරුවන් අවිවාහක විය යුතුවන අතර පුහුණු කාලය තුළ අවිවාහකව සිටිය යුතු ය.

v. ප්‍රායෝගික කෘෂිකර්මයේ නියැලීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවිය යුතු ය. (මෙය සනාථ කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් සහතිකයක් පාඨමාලාව සඳහා ලියාපදිංචියේ දී ඉදිරිපත් කළ යුතු ය.)

vi. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් හෝ ලිඛිත පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ.

**04. පාඨමාලාව සඳහා දිරි ගැන්වීමේ දීමනා:**

i. පුහුණුව සඳහා නේවාසිකව සිටින කාලය තුළ දිනකට එක් අයෙකු සඳහා රුපියල් පන්සියයක (රු.500/=) පුහුණු දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවනු ලැබේ.

ii. ඒ හැර ආහාර පාන හෝ වෙනත් කිසිදු දීමනාවක් ලබා නොදේ, එහෙත් කණ්ඩායමක් ලෙස අවශ්‍යවන්නේ නම් අරක්කැමියකුගේ සේවය ලබා දිය හැක.

iii. පුහුණුව ලබන කාලය තුළ දී සෑම සිසුවෙකුටම නේවාසිකාගාර පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

05. පාඨමාලාවට සහභාගිවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය :

i. පුහුණුලාභීන් විසින් පුහුණුව අවසානයේ ආපසු ගෙවනු ලබන රුපියල් දෙදහස් පන්සියයක (රු.2500/-) ඇප තැන්පතුවක් තැබිය යුතු ය.

ii. පුහුණුව සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව, අතරමග දී පාඨමාලාව හැර නොයන බවට රාජ්‍ය සේවයේ

මාණ්ඩලික නිලධාරියෙකු හෝ මාණ්ඩලික නොවන රාජ්‍ය නිලධාරින් දෙදෙනෙකුගේ අත්සනින් යුතු රුපියල් දස දහසක (රු. 10,000/-) ඇප බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතු ය.

iii. පුහුණුවෙන් පසු රැකියාවක් සැපයීමට බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ බස්නාහිර පළාත් සභාව බැඳී නොමැති බව විශේෂයෙන් අවධාරණය කෙරේ.

iv. පුහුණුව ලබන කාලය තුළ දී පුහුණු ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පොදු නීතිරීතිවලට එකඟ වන බවට ලිඛිතව ප්‍රකාශ කළ යුතු ය.

v. පුහුණු කාල සීමාව තුළ විනය විරෝධී හෝ නීති-රීති වලට පටහැනිව කටයුතු නොකළ යුතු අතර එසේ කරන්නන්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට වුව ද බලධාරින් විසින් කටයුතු කරනු ලැබේ.

06. මෙහි පහත සඳහන් ආකෘතිය අනුව අඟල් 8 1/2x12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත් අයදුම්පත් සමඟ පාසල් හැරයාමේ සහතිකය සහ අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද ඡායාපිටපතක් ද අමුණා **2026.01.23** දිනට හෝ එදිනට පෙර **"පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර), පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 7 මහල, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල."** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ pdagriwp@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවිය යුතුය. මීට අදාළ වැඩි විස්තර ලබා ගැනීම සඳහා සහ මාර්ගස්ථ ක්‍රමයට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා **https://agridept.wp.gov.lk** අපගේ වෙබ් අඩවියට පිවිසිය හැක. මාර්ගස්ථ ක්‍රමයට අයදුම්කිරීම දිරිමත් කෙරේ.

ඔබගේ අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන විට අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ **" කෘෂිකර්ම පුහුණු පාඨමාලාව- 2026 "** යනුවෙන් ලියා එවිය යුතු ය.

i. බඳවා ගැනීම සම්බන්ධව අවසාන තීරණය බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු ය.

ii. අසම්පූර්ණව හෝ අවිධිමත්ව කෙරෙන ඉල්ලීම් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ / සහභාගී විය යුත්තේ මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණි.

**සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ලේඛන**

i. දැනට පාසල් හැර ගොස් ඇති ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ට පමණක් සැලකිල්ලක් දක්වන බැවින් සම්මුඛ පරීක්ෂණයේ දී පාසල් හැරයාමේ සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

ii. තමා අධ්‍යාපනය ලැබූ විදුහලෙන් සහ ප්‍රදේශයේ ආගමික නායකයෙකුගෙන් හෝ පිළිගත් රාජ්‍ය නිලධාරියෙකු වෙතින් මෑතක දී ලබා ගත් චරිත සහතිකයක් ලෙස චරිත සහතික දෙකක්, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සඳහා අදාළ සහතික.

iii. ජාතික හැඳුනුම්පත.

iv. පදිංචිය තහවුරු කිරීම සඳහා තමා ස්ථිරව පදිංචි ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරිවරයා වෙතින් ලබා ගත් සහතිකයක්.

v. ඉහත සඳහන් කළ සහතිකපත් හා ලේඛනවල මුල්පිටපත් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

**ලියාපදිංචියේ දී ඉදිරිපත් කළ යුතු ලේඛන**

i. ප්‍රායෝගික කෘෂිකර්මයේ නියැලීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන බව සනාථ කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකය.

ii. අදාළ සහතික හා ලේඛණවල සහතික කරන ලද ඡායා පිටපත්.

* මෙම නිවේදනය යටතේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් එවිට සිංහල භාෂා නිවේදනය ප්‍රමුඛ වේ.

**එස්. බී. ඒ. එම්. ඒ. එම්. ගුණවර්ධන,**
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,
බස්නාහිර පළාත.

2025 ජනවාරි මස 02 දින
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර ) ,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,
බස්නාහිර පළාත් සභාව, අංක 204,
7 මහල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**හෝමාගම (පිරිමි), වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන්හි පැවැත්වෙන එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව හා සමගාමීව "ක්ෂේත්‍ර සහකාර (කෘෂිකාර්මික ව්‍යාප්ති)" ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 පුහුණු පාඨමාලාව -2026**

**2026 වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

<u>අපේක්ෂකයා පිළිබඳ තොරතුරු</u>

1. සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................................................................
..........................................................................................................................

2. (I) ලිපිනය : ……………………………………………………………………………………..............
……………………………………………………………………………………………………
(II) දිස්ත්‍රික්කය : ..........................................................................................................
(III) පළාත : …………………………………………………………………………………...................

3. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

4. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

5. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

6. නිවසේ දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

7. විද්‍යුත් ලිපිනය:

8. ස්ත්‍රී /පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

9. උපන් දිනය

වර්ෂය: ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

10. (I) හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(II) හැඳුනුම්පත නිකුත් කළ ආයතනය හා දිනය: ……………………………………

11. පියාගේ හෝ භාරකරුගේ නම : ……………………………………………............................

12. පියාගේ හෝ භාරකරුගේ ලිපිනය : …………………………………………………………...............

13. මවගේ නම: ……………………………………………………………………………………………..

මවගේ දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

14. හදිසි අවස්ථාවක දී දැනුම් දිය යුතු අය : නම හා දුරකථන අංකය :

නම : ..........................................................................................................................

දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

15. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය

පළමුවර : (................ වර්ෂය) විභාග අංකය : (....................................)

| සමත් විෂයය | ලැබූ සාමාර්ථය | සමත් විෂයය | ලැබූ සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10 | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය
දෙවන වර : (................ වර්ෂය ) විභාග අංකය : (....................................)

| සමත් විෂයය | ලැබූ සාමාර්ථය | සමත් විෂයය | ලැබූ සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10 | |

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය (................ වර්ෂය ) විභාග අංකය: (…………………….)

| සමත් විෂයය | ලැබූ සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

(D) වෙනත් අධ්‍යාපන සුදුසුකම් (උදාහරණ. අ.පො.ස. (සා.පෙ.) දක්වා උගත්) :- කරුණාකර විස්තර කරන්න

17. වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් (සම්පූර්ණ කර ඇති NVQ 3 පුහුණු පාඨමාලා හා වෙනත් පාඨමාලා ) :-

I.
II.
III.

18. බාහිර සුදුසුකම් හා බාහිර ක්‍රියාකාරකම් :-

I.
II.
III.
IV.
V.

19. ඔබ උසස් අධ්‍යාපන ආයතනයක හෝ කාර්මික විද්‍යාලයක / ආයතනයක පාඨමාලාවක් සඳහා තේරීපත් වී සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

.................................................................................................................................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. කිසියම් තොරතුරක් අසත්‍ය යැයි මා තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් කිසිම පරීක්ෂණයකින් තොරව මාගේ ශිෂ්‍යභාවය අවලංගුවන බව දනිමි.

............................................ ....................................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

01 - 105

---

## ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය
## (2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

මානව සම්පත් සංවර්ධනය සහ පොදු කාර්යාලීය පරිපාලන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - ව්‍යාපාර අධ්‍යයන සහ මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව 2026
(දෙවන - ප්‍රධාන බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යාපාර අධ්‍යයන සහ මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක මානව සම්පත් සංවර්ධනය සහ පොදු කාර්යාලීය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා පිළිගත් වෘත්තීය මානව සම්පත් කළමනාකරුවෙකු වීමට හෝ මානව සම්පත් සංවර්ධන නිලධාරියෙකු වීමට හෝ එම ක්ෂේත්‍රයේ ඉහළ තනතුරු සඳහා අවශ්‍ය වෘත්තීය, අධ්‍යාපන සුදුසුකම බලාපොරොත්තු වන රාජ්‍ය සහ පෞද්ගලික නිලධාරින්ට පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකි ය.

*සුදුසුකම් :*

අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S3 සාමාර්ථය සහිතව සමත් වීම;

*සහ*

2026.01.01 දිනට වයස 18ට වැඩි වීම හා යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම

*පාඨමාලාවේ ස්වභාවය :* මාර්ගගත ඉගැන්වීමේ ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

*මාධ්‍ය :* සිංහල හෝ ඉංග්‍රීසි

*පාඨමාලා කාලය :*

එක් අවුරුදු අර්ධ කාලීන පාඨමාලාවකි. පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු : මුළු පාඨමාලා ගාස්තුව රු. 36,000 කි.

පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1,000.00ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතු ය.

රු. 36,000.00 ක මුදල එකවර හෝ රු. 3,000.00 බැගින් දොළොස් මාසිකව ගෙවිය හැකි ය.

පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :

අයදුම්කරු විසින්,

1. අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ සත්‍ය ඡායාරූපය,
2. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ/ විදේශ ගමන් බලපත්‍රයේ ඉදිරිපස සහ පිටුපස ඡායාරූපය,
3. සේවා සහතික (ඇත්නම්)

070-5508778 (Whatsapp) අංකයට යොමු කළ යුතු ය.

වැඩි විස්තර සඳහා : කාර්යාලීය වේලාවන් පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 037-3170999 දුරකථන අංකය හරහා විමසිය හැකි ය.

ලේඛකාධිකාරි,
ව්‍යාපාර අධ්‍යයන සහ මානව සම්පත්
සංවර්ධන දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

01 - 148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.